කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

දේශපාලන විද්‍යාව

රාජ්‍ය පරිපාලනය හා විමධ්‍යගතකරණය **POLS – E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. 'රාජ්‍ය පරිපාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි විද්වත් අර්ථ කථන ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. රාජ්‍ය පරිපාලනය සහ ව්‍යාපාරික පරිපාලනය අතර පවතින සමානකම් සහ අසමානකම් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී නිලබලතාන්ත්‍රිකයින්ගේ භූමිකාව විග්‍රහ කරන්න. (ලකුණු 20)

04. මැක්ස් වෙබර් ඉදිරිපත් කරනු ලැබූ 'නිලබල ක්‍රමය පිළිබඳ න්‍යායෙහි' මූලික ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 20)

05. i. විමධ්‍යගතකරණය අර්ථ නිරූපණය කර විමධ්‍යගතකරණ ආකාර ලුහුඬින් විස්තර කරන්න. (ලකුණු 10)

    ii. විමධ්‍යගතකරණයෙහි වාසි, අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

06. "ප්‍රංශ පළාත් පාලනය දැඩි ලෙස මධ්‍යගතකරණය වූ ක්‍රමයකි." සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. "ෆුල්ටන් කමිටු යෝජනා මගින් බ්‍රිතාන්‍ය සිවිල් සේවාව නව මාවතකට යොමු කරනු ලැබිණි." විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

08. i. ඉන්දියාවේ පංචායත් රාජ් ක්‍රමයේ ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 10)

    ii. ඉන්දියාවේ සමාජ සහ ප්‍රාදේශීය සංවර්ධන ගැටලු විසඳීමට පංචායත් ක්‍රමයේ දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 10)

09. තෝරාගත් මාතෘකා දෙකක් (02) යටතේ ප්‍රමාණවත් සටහන් ලියන්න.

    i. POSDCoRB සංකල්පය
    ii. පරිපාලන විද්‍යාව සංවර්ධනයේ දී ලින්ඩල් උර්වික්ගේ දායකත්වය
    iii. ශ්‍රී ලංකා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය, බලතල සහ කාර්යයන්
    iv. හෝතෝන් පර්යේෂණය
    v. ශ්‍රී ලංකාවේ පළාත් ආණ්ඩුකාරධුරයේ බලතල සහ කාර්යයන්

(ලකුණු 10x2=20)

*******************************